සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම පළකෙරේ.
2010.09.17 වැනි දින පළ වූ අංක 1672 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,673 - 2010 සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා - 2010.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1576 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1581 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් සභාව

## කටාන ප්‍රාදේශීය සභාව

කටාන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| කාර්යාල කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 15 x 160- රු. 17,600 කාර්යක්ෂමතා කඩඉම හතරවන (12090) වාර්ෂික වැටුප් පියවරට පෙර | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |
| සෞඛ්‍ය කම්කරු | 09 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 15 x 160- රු. 17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| මාර්ග කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 15 x 160- රු. 17,600 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |
| මුරකරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 15 x 160- රු. 17,600 (12 වන පියවරේ සිට) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එක්වරක දී කවර හෝ විෂයන් හයකින් සමත් වී තිබිය යුතු ය. |

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

01. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
02. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ.)
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
05. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
06. කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට හා එම සභාවේ දැනට අනියම් හෝ ආදේශක හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සිටින අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් 2010.11.15 වැනි දිනට පෙර ලේකම්, කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් තම සේවා ප්‍රධානියා මඟින් එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කල පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතික ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් විය යුතු ය.);
5. වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

ඊ ඩී. නන්දාවතී,
ලේකම් *(වැ.බ.),*
කටාන ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 06 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කටාන ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................................................ තනතුර සඳහා අයදුම්පත***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර ලිපිනය :——————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :___________.
05. උපන් දිනය:
    වර්ෂය :——————., මාසය:——————., දිනය:——————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
    අවුරුදු ඃ ——————. මාස :——————. දින:——————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————. විවාහක/අවිවාහක බව : ——————.
08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————.
09. අධ්‍යාපන සුදුසුකම් ඃ- (සහතික වල පිටපත් ඇමිණිය යුතුය):——————.
    අ.පො.ස. (සා.පෙළ) විභාගය
    සමත් වර්ෂය හා විභාග අංකය ඃ-

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

10. i. වෙනත් සුදුසුකම් : ——————.
    ii. වෘත්තීය සුදුසුකම් : ——————.
    iii. සේවා පළපුරුද්ද : ——————.

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර එම පත්වීමේ ස්වභාවය ස්ථිර/අනියම්/තාවකාලික : ——————.

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකුවන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

____________
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරුවන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————.
ආයතන ප්‍රධානියා.

අත්සන : ——————.
නම : ——————.
පදවිය : ——————.
දිනය : ——————.

09-1171

## ගාල්ල මහ නගර සභාව

ගාල්ල මහ නගර සභාවේ පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ගාල්ල මහ නගර සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| පුස්තකාල සහායක | 03 | රු. 11,730 - 120 x 10 - 130 x 10 -145 x 10 160 x 12- රු. 17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය ඇතුළු විෂයයන් 06කින් සමත්වීම |
| කම්කරු | 37 | රු. 11,730 - 18 x 120 - රු. 13,890 | 8 ශ්‍රේණිය සමත්විය යුතු ය. |
| කාර්යාල කම්කරු | 07 | රු. 11,730 - 18 x 120 - රු. 13,890 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම |
| මෝටර් කාර්මික | 01 | රු. 12,210-18x130- රු. 14,550 | අ.පො.ස. (සා.පෙළ) අවම විෂයයන් 06කින් සමත්වීම. රජයේ පිළිගත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු වෘත්තීය පුහුණුවක් සාර්ථකව අවසන්කළ අයෙකු විය යුතු ය. |
| කම්බිකරු සහායක | 01 | රු. 12,210-18x130- රු. 14,550 | 8 ශ්‍රේණිය සමත්වීම අදාල වෘත්තියේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම |
| මැහුම් උපදේශිකා | 01 | රු. 12,470 - 18 x 130 රු. 14,810 | අ.පො.ස. (සා.පෙළ) සිංහල, ගණිතය, ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළු අවම විෂයන් 06න් සමත්වීම |
| කාර්යාල කාර්ය සහායක | 02 | රු. 12,210-18x130- රු. 14,550 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම |
| සුළු පරිපාලක | 02 | රු. 12,470 - 18 x 130 රු. 14,810 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වීම හා මුදල් ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් එක් වසරක පළපුරුද්ද |
| නිරීක්ෂක | 08 | රු. 12,470 - 18 x 130 රු. 14,810 | අ.පොස. (සා.පෙළ) සමත්වීම |
| ආරක්ෂක නියාමක | 13 | රු. 12,210-18x130- රු. 14,550 | 8 ශ්‍රේණිය ( 9 වසර) සමත්වීම |

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය , පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය.

(iii) අයදුම්කරු දකුණු පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(vi) ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛත්වය ලැබෙන අතර දැනට ගාල්ල මහ නගර සභාවේ තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවක සේවිකාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ගාල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සහිතය.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.

(ii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛණයේ පිටපතක් හෝ මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික ;
6. රියදුරු තනතුර සඳහා නම් රියදුරු බලපත්‍රය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. අයදුම්පත් ඉදිරිපත් කිරීම

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.10.08 වැනි දිනට පෙර හෝ එදිනට ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙත්සිරි ද සිල්වා,
නගරාධිපති,
මහ නගර සභාව - ගාල්ල.

2010 ක් වූ අගෝස්තු මස 27 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ගාල්ල මහ නගර සභාව**

**........................................................................................ තනතුර සඳහා අයදුම්පත**

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
02. i. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
ii. ස්ථිර ලිපිනය :————————.
03. උපන් දිනය:
අවුරුදු :————————., මාස :————————., දින:————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :____________.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ————————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:
අවුරුදු :————————., මාස :————————., දින:————————.
07. විවාහක/අවිවාහක බව:————————.
08. ජාතිය :————————.
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද? යන වග :————————.
10. අධ්‍යාපන සුදුසුකම් :————————.
11. වෘත්තීය සුදුසුකම් : ————————.
12. ඔබ දැනටමත් මෙම සභාවේ සේවය කරන්නේ නම් : -
(i) දැනට දරන තනතුර : ————————.
(ii) එම තනතුරට පත්වූ දිනය : ————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද : ————————.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? යන්න ඇතුළත් කළ යුතු ය. :
14. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

____________
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————————.

15. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්කරුවන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයෙන් විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව ද, මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ————————.
පදවි නාමය : ————————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ————————.
නිල මුද්‍රාව : ————————.
දිනය : ————————.

09-1205
F2 - B 080155 (S/E)

## කරන්දෙනිය ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛණයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා දකුණු පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට හා දැනටමත් අනියම් හා ආදේශක සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

**උපලේඛනය**

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු | 01 | රු. 12,470 - 10 x 130 -10 x 145 - 10 x 160- 12 x 170 - රු. 18,860 | යටත් පිරිසෙයින් 5 වන ශ්‍රේණිය සමත් විය යුතුය. |

*බඳවා ගැනීම සඳහා වන කොන්දේසි :-*

01. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය,
02. අයදුම්කරු දකුණු පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය,
03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට හා දැනටමත් අනියම් හා ආදේශක සේවයේ නියුක්ත අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ,
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය (ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනමට පත්වීම අවුරුදු 18ත් අවුරුදු 45ත් අතර සිදුවී තිබිය යුතුය.)
05. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයෙන් හා විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය,
06. බරවාහන රියදුරු බලපත්‍ර සහිතව වසර 05ක පළපුරුද්ද ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ඇත,
07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය,
08. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමරතව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුවේ නියෝග වලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (අඟල් 12 x 8) ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර රියදුරු තනතුර සඳහා අයදුම්පත යනුවෙන් කවරයේ වම් පස ලියා 2010 ඔක්තෝබර් 21 වැනි දිනට පෙර සභාපති, ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දින පසු වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතිකවල පිටපත් එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතික ;
4. මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය;
5. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
6. බර වාහන වලංගු රියදුරු බලපත්‍රයේ සහතික පිටපතක්;
7. සේවා පලපුරුද්ද පිළිබඳ සහතිකය.

ගාමිණී අමරවංශ මුණුගොඩ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කරන්දෙණිය,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*කරන්දෙණිය ප්‍රාදේශීය සභාව*

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ .......................................................................................... තනතුරු සඳහා බඳවාගැනීම***

01. මුලකුරු සමග නම :——————.
 මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :____________.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
06. උපන් දිනය: අවුරුද්ද :——————., මාසය:——————., දිනය :——————.
07. 2010.09.27 දිනට වයස ඃ අවුරුදු ඃ ——————, මාස :——————, දින:——————.
08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————.
09. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————.
10. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.)
11. සේවා පළපුරුද්ද : ——————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.
13. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි/නොකරමි.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම : ——————.
පදවිය : ——————.

දෙපාර්තමේන්තුව/ආයතනය
(නිල මුද්‍රාව යොදන්න).

දිනය : ——————.

09-1065

---

# පළාත් පාලන නිවේදන

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්ති ප්‍රකාරව අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශ, බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් දියුණු කළ ප්‍රදේශ ලෙස අනුමත කර ඇති බවත්, ඒ අනුව මෙම ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

චාමින්ද රණවක,
සභාපති,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 03 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සීමා මායිම් උපලේඛනය

අගලවත්ත කළවැල්ලාව ප්‍රධාන මාර්ගයේ බඹරගෙදර පිහිටි 25/5 දරන වරිපනම් සීමා බෝක්කුවේ මධ්‍ය ලක්ෂයේ සිට ප්‍රධාන මාර්ගයට සමාන්තරව පාර දෙපසින් මීටර් 100ක් දුරින් පිහිටි ලක්ෂයන් ද, එතැන් සිට අගලවත්ත කළවැල්ලාව ප්‍රධාන මාර්ගයේ පිඹුර නම් ගමේ ප්‍රධාන පාර දෙපස පිහිටි 28/1 දරන බෝක්කුවත්, 28/2 දරන බෝක්කුවෙහිත් මධ්‍ය ලක්ෂයන්හි සිට ප්‍රධාන පාරට සමාන්තරව පාර දෙපසට මීටර් 100ක් දුරින් පිහිටි ලක්‍ෂයන් යා කල කලාපය හා අගලවත්ත කලවැල්ලාව ප්‍රධාන මාර්ගයේ පිඹුර නම් ගමේ පිහිටි පොල්වත්ත, ගොඩහේනලන්ද නැමැති ඉඩමේ 1999.05.06 දිනැති පිඹුරුපත් අංක 1959 හි F1A දරන හෙක්ටයාර 0.8158 ක භූමි ප්‍රමාණයට සීමා මායිම් ලෙස ඃ

උතුරින් කැබලි අංක A1, F2A1 හා F2B1
නැගෙනහිරින් ප්‍රධාන මාර්ගයත්,
දකුණින් ප්‍රධාන මාර්ගයත්,

බටහිරින් කැබලි අංක F 1 හි ඉතිරි බිම් කොටසත් මායිම් වන භූමි ප්‍රමාණයත්, අගලවත්ත කලවැල්ලාව ප්‍රධාන මාර්ගයේ පිඹුර නම් ගමේ පිහිටි පොල්වත්තගොඩහේන ලන්ද නැමැති ඉඩමේ 1999.05.06 දිනැති පිඹුරුපත් අංක 1959 හි F2B1 දරන හෙක්ටයාර 0.4836 ක භූමි ප්‍රමාණයට සීමා මායිම් ලෙස,

උතුරින් TP 67616 දරන ඉඩමද ,
නැගෙනහිරින් ප්‍රධාන මාර්ගය ද,
දකුණින් කැබලි අංක F1A දරන බිම් කැබැල්ල ද,

බටහිරින් කැබලි F2A1 අංක දරන බිම් කැබැල්ල ද, මායිම් වන භූමි ප්‍රමාණයත් අගලවත්ත කළවැල්ලාව ප්‍රධාන මාර්ගයේ පිඹුර නම් ගමෙහි පිහිටි පොල්වත්ත ගොඩහේනලන්ද නැමැති ඉඩමේ 1999.05.06 දිනැති පිඹුරුපත් අංක 1959 හි F2A1 දරන හෙක්ටයාර 0.2029ක භූමි ප්‍රමාණයට සීමා මායිම් ලෙස,

උතුරින් කැබලි අංක F2A දරන බිම් කැබැල්ලක් ද,
නැගෙනහිරින් කැබලි අංක F2B1 දරන බිම් කැබැල්ල ද,
දකුණින් කැබලි අංක F1A දරන බිම් කැබැල්ල ද,
බටහිරින් කැබලි අංක A1 දරන බිම් කැබැල්ල ද මායිම් වන භූමි ප්‍රමාණයත්,
අගලවත්ත කලවැල්ලාව ප්‍රධාන මාර්ගයේ පිඹුර නම් ගමෙහි පිහිටි පොල්වත්ත ගොඩහේනලන්ද නැමැති ඉඩමේ 1999.05.06 දිනැති පිඹුරුපත් අංක 1959 හි A 1 දරන හෙක්ටයාර 0.1164 ක භූමි ප්‍රමාණයට සීමා මායිම් ලෙස,

උතුරින් කැබලි අංක A හි ඉතිරි බිම් කොටසත්,

නැගෙනහිරින් කැබලි අංක F2A1 දරන බිම් කැබැල්ල ද දකුණින් F2A1 සහ F1A දරන බිම් කැබලිත් බටහිරින් මිල්ලගහවත්ත නැමැති ඉඩමිනුත් මායිම් වන කලාපයන් සීමා මායිම්වේ.

09-1081

---

## සංශෝධනය යි

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

2010.07.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ (පළාත් සභා) පූජාපිටිය ප්‍රාදේශීය සභාව මගින් වරිපනම් බදු සම්බන්ධව පල කරන ලද *ගැසට් නිවේදනය* සංශෝධනය කිරීම.

එහි පළමු ඡේදයේ පළමු පේළියේ 1987 අංක 15 දරන 134(1) හා 134(2) යනුවෙන් ද,
1340 පිටුවේ අංක 5 යටතේ සඳහන්,
අත්තරගම පාර වම මීටර් 150 යනුවෙන් ද සංශෝධනය කරනු ලබන බව දැනුම් දෙමි.

අනුර හේමන්ත විජේරත්න,
සභාපති.

පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.
2010 අගෝස්තු මස 25 වැනි දින.

09-1084

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම් වලින් අදාළ බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

චන්ද්‍රන සිරිබද්දන,
සභාපති.

ප්‍රාදේශීය සභාව,
කඹුරුපිටිය.

### උපලේඛනය

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - මාර්ග ලියාපදිංචි කිරීම**

| *පාරේ නම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර මීටර්* | *පළල අඩි* |
|---|---|---|---|---|---|---|
| | *වම* | *දකුණ* | | | | |
| කරපුටුගල උතුර ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 01. හොරකුට්ටිය බටුහේන මාර්ගය | නමාමිය දොල රජයේ ඉඩම හොරකුට්ටියහේන ඇල්හේන (ලියන්ගස්ආර) | නමාමිය දොල රජයේ ඉඩම හොරකුට්ටියහේන බටුහේන | නමාමිය දොල | බටුහේනවත්ත | 570 | 12 |
| තුඹේ ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 02. කඹුරුපිටිය කිරින්ද ප්‍රධාන මාර්ගයේ සිට පහල බදුවත්ත දක්වා මාර්ගය | බදුවත්ත 1,2 ඉඩම් බදුවත්ත 3 ඉඩම් පහල බදුවත්ත, 1 ඉඩම් පහල බදුවත්ත 2,3 ඉඩම් | ආත්තලාගේවත්ත 1,2.3 ඉඩම් | කඹුරුපිටිය කිරින්ද ප්‍රධාන මාර්ගය | පහලබදුවත්ත | 500 | 12 |
| මලාන ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 03. මැදකුට්ටිය ලාවල්ලගහ දෙනිය මාර්ගය | ගලබඩදෙනියවත්ත ඉලුක්කැටිය හේන ගෙදරවත්ත ඉලුක්කැටියහේන ගෙදරවත්ත ඉලුක්කැටියවත්ත | මැදකුට්ටිය ඉහල වැව කුඹුර ගලබඩදෙනියවත්ත 1,2,3 ඉඩම් කැබලි | මැදකුට්ටිය | ලාවල්ලගහදෙනිය | 530 | 12 |
| කරපුටුගල දකුණ ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 04. නරුස්ස පන්සලේ ලියද්ද පාර | මහලියද්ද දෙපෑල ගොඩකුඹුර තෝරපිටිය | නරුස්ස පිටවාන් ඇල | නරුස්ස කුඹුර කරපුටුගල දකුණ | පන්සලේ ලියද්ද | 1000 | 10 |
| මගමුරේ ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 05. ලියනගහවත්ත ඇතුළු පාර | ලියනගේවත්ත අංක 06 ඉඩම ලියනගෙවත්ත අංක 05 ඉඩම ලියනගෙවත්ත අංක 02 ඉඩම ලියනගෙවත්ත අංක 03 ඉඩම මස්ටකයමුල්ල | ලියනගෙවත්ත අංක 07 ඉඩම ලියනගෙවත්ත අංක 04ඩී ඉඩම ලියනගෙවත්ත අංක 04සී ඉඩම ලියනගෙවත්ත අංක 04බී ඉඩම මස්ටකයමුල්ල | ලියනගහවත්ත | මස්ටකයමුල්ල සරත් විජේසිංහ මහතාගේ නිවස අසල දක්වා | 100 | 12 |

| පාරේ නම | දෙපස ඇති ඉඩම් - වම | දෙපස ඇති ඉඩම් - දකුණ | ආරම්භය | අවසානය | දුර මීටර් | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| කරගොඩ උයන්ගොඩ I අත ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 06. අකුරුස්ස කද්දුව පාරේ සිට වීරපානිගෙවත්ත දක්වා වැටී ඇති පාර | හෙට්ටිගෙදරවත්ත 2,3,4 ඉඩම් කැබලි වීරපානිගෙවත්ත 12,13,15 කැබලි ප්ලෑන් අංක 389 | හෙට්ටිගෙදරවත්ත 2,3,1 ඉඩම් කැබලි වීරපානිගෙවත්ත 10 කැබැල්ල | අකුරුස්ස කද්දුව පාරේ සිට හෙට්ටිගෙදරවත්ත | ගමගෙවත්ත නොහොත් අඹේගෙවත්ත මායිම දක්වා | මීටර් 70 | අඩි 14 |
| ඉහල විටියල දකුණ ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 07. පල්ලවකන්ද වේල්ල | එස්. එල්. එන්. පියසේන මහතාගේ ඉඩම | ඒ. ඩබ්. ඒ. සෝමපාල මහතාගේ ඉඩම ඩබ්. ඒ. ඉන්දික මහතාගේ ඉඩම කුමාර විජේසිංහ මහතාගේ ඉඩම විජේසිංහ ආරච්චිලාගේ ලසන්ත මහතාගේ ඉඩම | වේරකවිල | ඉරිකොන්දවත්ත | මීටර් 800 | අඩි 12 |
| සපුගොඩ ග්‍රාම නිලධාරි වසම : | | | | | | |
| 08. විල්ලි ඉහල වත්ත මාර්ගය | විල්ලි ඉහලවත්ත මාගේස් හේවගේ ඉඩම හිත්තැටියගේ ගිමාර හාමි මියගේ ඉඩම | විල් ඉහල වත්ත | ගතාර පාර | විල්ලි ඉහල වත්ත | මීටර් 40 | අඩි 12 |

09-1188

---

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම් වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේශබන්දු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 09 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය, බෝයගනේ.

### උපලේඛනය

| පාරේ නම | දිග | පළල | වම්පස ඉඩම් හිමියන් | දකුණු පස ඉඩම් හිමියන් |
|---|---|---|---|---|
| 01. ලින්ක්වුඩ් පෙදෙස අරලිය මාවත | අඩි 201 | අඩි 14 | 1. සිරිපාල විදානගම මයා<br>2. රිස්වි මයා | 1. අජන්තා නන්දාවතී මිය<br>2. ර.ජ.මු. ගුණසේකර මයා |
| 02. සඳුන් මාවත | අඩි 786 | අඩි 14 | 1. පොල් වගාකිරීමේ මණ්ඩලය | 1. ටී. බී. ජයසුන්දර මයා |

| පාරේ නම | දිග | පළල | වම්පස ඉඩම් හිමියන් | දකුණු පස ඉඩම් හිමියන් |
|---|---|---|---|---|
| | | | | 2. මලිමීවල මයා |
| 03. අශෝක මාවත | අඩි 786 | අඩි 24 | 1. එඩ්මන්ඩ් සිල්වා මයා | 1. කමල් ජයසිංහ මයා |
| | | | 2. චන්දන පතිරණ මයා | 2. ඊ. ඇම්. දසනායක මයා |
| | | | 3. කළුහෙන්දිවල මයා | 3. සිරිවර්ධන මයා |
| | | | 4. ගාමිණී වීරබන්නැහැක මයා | 4. ටී. බී. නන්දසේන මයා |
| | | | 5. ගාමිණී මැදගම මයා | 5. අශෝකා ස්වර්ණලතා මිය |
| | | | | 6. රජයේ ඉඩම |
| 04. නාමල් මාවත | අඩි 473 | අඩි 22 | 1. සිරිවර්ධන මයා | 1. ඊ. ඇම්. දසනායක මයා |
| | | | 2. ඔබේසේකර මයා | 2. ඒ. වනසිංහ මයා |
| | | | 3. එන්. වීරසිංහ මයා | 3. එස්. එම්. එම්. පියසේන මයා |
| | | | 4. කේ. දසනායක මයා | 4. රංජිත් නවරත්න මයා |
| | | | 5. කුලසේකර මයා | 5. රිස්වි මයා |
| | | | 6. ජේ. ඇම්. අරුණශාන්ත මයා | 6. ර.ජ.මු. ගුණසේකර මයා |
| | | | 7. ඇතුලත්මුදලි මයා | 7. පී. බී. හේරත් මයා |
| 05. නෙළුම් මාවත | අඩි 582 | අඩි 20 | 1. පී. ඇම්. ජයතිලක මයා | 1. සමුපකාර මණ්ඩලය |
| | | | 2. ටී. බී. ජයසුන්දර මයා | 2. ග්‍රාම සංවර්ධන සමිති ශාලාව |
| | | | 3. මල්මීවල මයා | 3. බී. ඇම්. පියසේන මයා |
| | | | 4. ඩබ්. සමරසිංහ මයා | 4. ස්වර්ණා රත්නායක මිය |
| | | | 5. පියදාස මයා | 5. ඩී. ඩී. ජයවර්ධන මයා |
| | | | 6. අප්පුහාමි මයා | 6. රජයේ ඉඩම |
| 06. කුමුදු මාවත | අඩි 772 | අඩි 24 | 1. ග්‍රාම සංවර්ධන සමිති ශාලාව | 1. සමුපකාර මණ්ඩලය |
| | | | 2. පී. බී. තෙන්නකෝන් මයා | |
| | | | 3. මාග්‍රට් මිය | |
| | | | 4. ඩී. වීරක්කොඩි මයා | |
| | | | 5. මාලා දිසානායක මිය | |
| | | | 6. පද්මා බණ්ඩාර මිය | |
| | | | 7. රජයේ ඉඩම | |
| | | | 8. පී. ඩී. ඩිංගිරියා මයා | |
| 07. රෝස මාවත | අඩි 479 | අඩි 20 | 1. පී. බී. තෙන්නකෝන් මයා | 1. මාග්‍රට් මිය |
| | | | 2. විපුල රණසිංහ මයා | 2. ගුණසෝම මයා |
| | | | 3. එස්. එම්. ජයතිලක මයා | 3. කේ. ඒ. ඩී. ඒ. නානායක්කාර මයා |
| | | | 4. රංජිත් බණ්ඩාර මයා | 4. එම්. එම්. පී. හපුගොඩ මයා |
| | | | 5. බී. ඩී. ජයවර්ධන මයා | 5. එච්. ඇම්. ප්‍රේමරත්න මැණිකේ මිය |
| | | | 6. අමුණුගම මයා | 6. සමරකෝන් මයා |
| | | | 7. පුංචිබණ්ඩා මයා | 7. නිහාල් මයා |
| | | | 8. ආර්. ඇම්. රොෂාන් මයා | |
| 08. මානෙල් මාවත | අඩි 294 | අඩි 12 | 1. කේ. ඒ. ඩී. ඒ. නානායක්කාර මයා | 1. ගුණසෝම මයා |
| | | | 2. ඩබ්. ඇම්. අබේසිංහ මයා | 2. ඊ. ඇම්. ඩී. බී. ඒකනායක මයා |
| | | | 3. නිවාස සංවර්ධන අධිකාරිය | |
| | | | 4. ඉල්ලියාස් මයා | |
| | | | 5. නිවාස සංවර්ධන අධිකාරිය | |
| 09. කොළඹ පාරේ සිට කඳුරුකුඹුර දක්වා නව මාර්ගය | අඩි 357 | අඩි 13 | 1. එම්. හනීෆා මයාට අයත් කුඹුර | 1. කේ. වී. ශිරාණි පෙරේරා මිය |
| | | | | 2. එම්. ජී. ශාන්ත මයා |
| 10. ඉහළ මල්කඩුවාව ඕකිඩ් වත්ත මාවත | අඩි 980 | අඩි 10 | 1. ජේ. ඒ. චන්ද්‍රා වීරසූරිය මැණිකේ මිය | 1. ඩබ්. ලක්ෂ්මන් ජයසූරිය මයා |
| | | | 2. වී. එන්. සෝමබන්දු මයා | 2. ඩබ්. වනසිංහ මයා |
| | | | 3. ආර්. ඩී. ඇලිස්නෝනා මිය | 3. ආර්. ඩී. රංජිණී දේවි මිය |
| | | | 4. එම්. ඒ. විශාඛා වීරසිංහ මිය | 4. ඩබ්. එස්. ජයසූරිය මයා |
| | | | 5. ඩබ්. ශානිකා මිය | 5. ආර්. වයි. ඒ. සීතා රමණී මිය |

| පාරේ නම | දිග | පළල | වම්පස ඉඩම් හිමියන් | දකුණු පස ඉඩම් හිමියන් |
|---|---|---|---|---|
| 11. දංගොල්ල වත්ත පාර, දොරටියාව | අඩි 1645 | අඩි 16 | 1. එච්. ඒ. සෝමලතා රාජපක්ෂ මිය | 1. වයි. පී. කරුණාතිස්ස මයා |
| | | | 2. ආර්. කේ. නිසංකා ලක්මාලි රාජපක්ෂ මිය | 2. ඩබ්. පී. සුමනදාස මයා |
| | | | 3. බී. ඒ. පී. රත්නායක මයා | 3. එච්. අජිත් පියසේන මයා |
| | | | 4. එස්. කරුණාරත්න මයා | 4. ආර්. ජෝතිරත්න මයා |
| | | | 5. බී. සිරියාවතී මිය | 5. බී. සුනිල් ශාන්ත මයා |
| | | | 6. එම්. විජයසේන මයා | 6. පී. නන්දන ගුණසේන මයා |
| | | | | 7. එස්. ඒ. ජයතිස්ස මයා |
| | | | | 8. ඩබ්. අජිත් ධම්මික මයා |
| 12. අමුනේවත්ත ගලහිටියාව මාර්ගය | අඩි 465 | අඩි 10 | 1. එච්. එම්. සුනිල් පෙරේරා මයා | 1. මීකල් ජයන්ති සෝමවංශ වික්‍රමසිංහ මයා |
| | | | 2. පී. ජී. අටුගොඩ මයා | 2. ආසිරි වික්‍රමසිංහ මයා |
| | | | | 3. රුසිරි වික්‍රමසිංහ මෙනවිය |
| | | | | 4. කෞශල්‍යා වික්‍රමසිංහ මෙනවිය |
| 13. වැහැර වෙල මැද පන්සල මාර්ගය | අඩි 156 | අඩි 09 | 1. එස්. ඒ. කරුණාවතී මිය | 1. ආර්. එච් ආර්. නලින් සමන් හෙට්ටිආරච්චි |

09-1261

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.